# Covid 19- සති පාසල

# 10 ශ්‍රේණිය

# ඉතිහාසය

# ශ්‍රී ලංකාවේ පැරණි සමාජය

## 04 පාඩම

**<u>පළමුවන සතිය</u>**

**<u>04.1 පාලනයේ ස්වරූපය</u>**

- ඕනෑම රටක පාලනය මෙහෙයවන ප්‍රධාන ආයතන තුනක් තිබේ. ව්‍යවස්ථාදායකය,විධායකය, සහ අධිකරණය යනු එම ආයතන තුනයි.
- අතීතයේ දී අප රටෙහි ව්‍යවස්ථාදායකය සහ විධායකය යන ආයතන දෙකම එකම ආයතනයක් ලෙස ක්‍රියාත්මක විය. එය රාජ සභාව ලෙස හැඳින්වීය. ශිලා ලේඛනවල එය හඳුන්වා ඇත්තේ එක්තැන්සමිය යන නමිනි.
- ක්‍රි.ව. නව වන සියවසට අයත් සෙල්ලිපිවල අධිකරණය සභාව යන නමින් හඳුන්වා ඇති අතර එසේ නොයෙදෙන ඇතැම් තැන්වල එය මහලේ යන නමින් හඳුන්වා ඇත.
- රජු අග නගරයේ සිට රට පාලනය කළ අතර දුර බැහැර ප්‍රදේශ පළාත්වලට බෙදා ඇමතිවරු යටතේ පාලනය විය. ඊට වඩා පහළ ප්‍රදේශ පාලනය කිරීම සඳහා ප්‍රාදේශිය මට්ටමේ පරිපාලන මණ්ඩල පිහිටුවා තිබුණි.
- රාජ්‍ය පාලනයේ දී රටේ ජනතාවගේ සුබසිද්ධිය පතා කටයුතු කිරීමට පාලකයෝ ක්‍රියා කළහ. පොදු සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීම ඉන් වැදගත් එකකි.
- සිය අසල්වැසි රටවල් සමග මෙන්ම දුරු රටවල් සමග ද සුහදශීලී සබඳතා පැවැත්වීමට ද බුද්ධිමත් පාලකයෝ කටයුතු කළහ.

**<u>ක්‍රියාකාරකම්</u>**

1 පැරණි ශ්‍රී ලංකාවේ පරිපාලන කටයුතු පිළිබඳව තොරතුරු ඇතුලත්වන ශිලා ලේඛන නම් කර ඒවායේ සඳහන් වන වැදගත් තොරතුරු මොනවාදැයි වගු ගත කරන්න.

2 එක්තැන්සමිය, සභාව සහ දසගම් ඇත්තන් යන ආයතන සම්බන්ධයෙන් පහත අංශ යටතේ කෙටි විස්තර ලියන්න. ( ආයතනය,නිලධාරින්,කාර්යයන් සහ බලතල )

3 අතීතයේ මෙරට රජවරුන් විසින් ජනතාවගේ පොදු සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීම සඳහා සිදු කළ සේවාව කරුණු දෙකක් ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න.

4 මෙරට පාලකයින් විසින් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තියේ ස්වරූපය පහත අංශ යටතේ උදාහරණ සහිතව විස්තර කරන්න.

- තානාපති සබඳතා
- යුද භටයින් ගෙන්වා ගැනීම
- වෙළෙඳ සබඳතා
- විවාහ සබඳතා